**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
**Department of Examinations, Sri Lanka**
NATIONAL EVALUATION AND TESTING SERVICE

පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்தை, பத்தரமுல்ல
Pelawatta, Battaramulla.

මගේ අංකය / எனது இல / My No } 6/5/2023
ඔබේ අංකය / உமது இல / Your No } ..............................
දිනය / திகதி / Date } 2023.06.14

දුරකථන / தொலைபேசி / Telephones } 2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206,
ෆැක්ස් / பெக்ஸ் / Fax } 011-2785220
තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS: තැ.පෙ. 1503, කොළඹ / த.பெ. 1503 கொழும்பு / P.O.Box 1503 Colombo
අන්තර්ජාල ලිපිනය / இணையதள முகவரி / Internet Address } www.doenets.lk
E-mail : examd@sltnet.lk

සියලු ම විදුහල්පතිවරුන් වෙත,

**පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට**
**5 ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2023**
**අයදුම්පත් කැඳවීම**

උක්ත විභාගය 2023 ඔක්තෝම්බර් මස 15 දින පැවැත්වීමට තීරණය කර ඇත. ඒ අනුව මෙම වර්ෂයේ විභාගයට පෙනී සිටීමට නියමිත ඔබ පාසලේ අයදුම්කරුවන් සඳහා අවශ්‍ය අයදුම්පත් උපදෙස් සහ අදාළ ව්‍යවස්ථාව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් බාගත කර ගැනීමට අවස්ථාව ලබා දී ඇත. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2023.07.06** වන දින වේ.

02. මාර්ගගත (online) ක්‍රමයෙන් පමණක් අයදුම්පත් සම්පූර්ණ කර මුද්‍රිත පිටපතක් (printout) ලබා ගෙන අයදුම්කරුවන්ගේ උපන් දිනය සහ දෙමාපියන්ගේ/භාරකරුගේ ආදායම් තත්ත්වය පිළිබඳ දත්ත පරීක්ෂා කර අත්සන් ලබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට ලැබීමට සැලැස්විය යුතුය.

03. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් මාර්ග 3න් එක් මාර්ගයක් තෝරා ගන්න.

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, නිල වෙබ් අඩවිය (www.doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත (Click) කිරීම මගින් හෝ
- විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදවුම (mobile application) වන "DoE" වෙත පිවිස "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත (Click) කිරීම මගින් හෝ
- https://onlineexams.gov.lk/eic වෙත පිවිසීමෙන් පසු,

3.1 ලැබෙන ප්‍රවේශ කවුළුවේ, දැනටමත් ඔබට ලබාදී ඇති පරිශීලක නාම (school code) හා මුරපදය (password) ඇතුළත් කර පද්ධතියට ප්‍රවේශ වන්න.

3.2 Grade Five Scholarship - 2023 Student Registration තේරීමෙන් අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා ගත හැක.

04. මෙම විභාගය සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ දත්ත ඇතුළත් කරන අවස්ථාවේ අයදුම්කරුවන් සඳහා ඔබ විසින් අනන්‍යතා අංකයක් (unique identity number) ලබා දිය යුතු ය. එය පහත දැක්වෙන ආකාරයෙන් සකස් කර ගත යුතු ය.
විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති පරිශීලක නාමය (User Name) සමඟ ඊට ඉදිරියෙන් අනු අංකය යොදමින් ඉලක්කම් 8 න් සමන්විත වන ලෙස (පහත උදාහරණයේ සඳහන් පරිදි) අනන්‍යතා අංකය නිර්මාණය කර ගත යුතු ය.

- ✶ අනන්‍යතා අංකය සකස් කර ගැනීමේ දී එම අංකය, 0 න් ආරම්භ නොකළ යුතුයි.
- ✶ ඔබ පාසලේ පරිශීලක නාමය (User Name) (විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති) 0 න් පටන් ගන්නේ නම් එය ඉවත්කර ඉතිරි අංකය භාවිතා කරන්න.

උදා : 1. පරිශීලක නාමය (User Name) අංක 04 ක් යෙදී ඇත්නම්,
පරිශීලක නාමය (User Name) 04354 නම්,
අයදුම්කරුගේ අනු අංකය 1 නම් - අනන්‍යතා අංකය 43540001

2. පරිශීලක නාමය (User Name) අංක 05 ක් යෙදී ඇත්නම්,
පරිශීලක නාමය (User Name) 14129 නම්,
අයදුම්කරුගේ අනු අංකය 1 නම් - අනන්‍යතා අංකය 14129001

05. පාසලේ දුරකථන අංකය සඳහන් කිරීම අත්‍යවශ්‍ය වන අතර පහසුවෙන් විදුහල්පති සම්බන්ධ කර ගත හැකි ජංගම දුරකථන අංකයක් හා විෂය භාර ගුරු භවතාගේ දුරකථන අංකය ද සඳහන් කිරීමට කාරුණික වන්න.

06. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබන්නේ අදාළ ව්‍යවස්ථාවට අනුව අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ රජයේ පාසලක හෝ රජය විසින් අනුමත කරනු ලැබූ පාසලක 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් පමණි. එසේ වුව ද ශිෂ්‍යාධාර ලබා ගැනීම සඳහා හිමිකම ඇත්තේ එම සිසුන් අතර සිටින 2024 ජනවාරි මස 31 දිනට වයස අවුරුදු 11ට අඩු හා අවුරුදු 10 හෝ 10ට වැඩි සිසුන්ට පමණි.

07.

7.1 ඔබ විසින් අයදුම්පත් සම්පූර්ණ කිරීම ඉතාමත්ම නිවැරදිව සිදු කළ යුතුය. 2023.07.06 මධ්‍යම රාත්‍රී 12න් පසුව මාර්ගගත වැඩසටහන වසා දැමීමෙන් පසුව උඩුගත කරන ලද **අයදුම්කරුවන්ගේ තොරතුරු කිසිදු හේතුවක් මත වෙනස් කරනු නොලබන** බැවින් මුල් අවස්ථාවේදීම නිවැරදි තොරතුරු උඩුගත කිරීම විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ වගකීමක් බව කරුණාවෙන් සලකන්න.

7.2 උඩුගත කරන ලද අයදුම්පත් (PDF) මුද්‍රණය කර එය එක් එක් අයදුම්කරුවන්ගේ තොරතුරු පිළිබඳව තනි තනිව පරීක්ෂා කර බලා මුද්‍රණය කරගත් (PDF) පිටපතෙහි පමණක් අයදුම්කරුවන් හා දෙමාපියන්/භාරකරුවන්ගෙන් අත්සන් ලබාගෙන විභාග දෙපාර්තමේන්තුව විමසන අවස්ථාවක ඉදිරිපත් කිරීම සඳහා පාසලේ සුරක්ෂිතව තබාගත යුතුයි. (පාසලෙන් සකස් කර ගත් (Excel Sheet) පිටපතේ අත්සන් ලබා ගැනීම නොකළ යුතුයි.)

7.3 **එහිදී සම්පූර්ණ නම, උපන් දිනය, මාධ්‍යය, ස්ත්‍රී/පුරුෂ භාවය සහ ආදායම යනාදී සියලු ම තොරතුරු නිවැරදිව ඇතුළත් වී ඇත්දැයි පරීක්ෂා කර බලා තහවුරු කර ගන්නා ලෙස දෙමාපියන්/භාරකරුවන් හට උපදෙස් ලබා දිය යුතුය.**

ඔබ විද්‍යාලයෙන් දෘෂ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඔවුන් වෙනුවෙන් සබැඳියේ (link) ඇති වෙනම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. මෙවැනි විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති සිසුන් වෙනුවෙන්

- රත්මලාන අන්ධ විදුහල, රත්මලාන
- පොලොම්මාරුව අඳ බිහිරි විදුහල, තංගල්ල
- නෆීල්ඩ් විදුහල, කයිතඩි.

විශේෂ විභාග මධ්‍යස්ථාන සහ වෙනත් සුදුසු මධ්‍යස්ථාන පිහිටුවීමට සලකා බලනු ලැබේ.

08. පසුගිය වර්ෂයේදී ඔබ පාසලේ අයදුම්කරුවන් පෙනී සිටි විභාග මධ්‍යස්ථානයට වඩා පහසු මධ්‍යස්ථානයක් ඇත්නම් එය වෙනස් කර දෙන ලෙස අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන්න.

09.

9.1 අයදුම්කරුවන් ශිෂ්‍යාධාර අපේක්ෂා කරන්නේ නම් ඔවුන්ගේ දෙමාපියන්/නීත්‍යානුකූල භාරකරුවන් සියලු ම මාර්ගවලින් වර්ෂයකට රු. 180,000.00 හෝ ඊට අඩු ආදායම් ලබන අය විය යුතු ය.

9.2 රජය මගින් ක්‍රියාත්මක කරන "සමෘද්ධි" වැඩසටහන මගින් ලැබෙන ප්‍රදානයන් මෙම ආදායම් සීමාවට බලපානු නොලැබේ.

9.3 මෙම සුදුසුකම් සනාථ කිරීම සඳහා මුළු වාර්ෂික ආදායම පිළිබඳව ඔබ විසින් අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරන ලදුව ආදායම අඩු හෝ වැඩි ලෙස සඳහන් කර නැවත ඔබ වෙත ලබාගත් ලේඛන පදනම් කරගත යුතු අතර එම ලේඛන ආරක්ෂා සහිතව ගොනුකර තැබිය යුතු ය.

9.4 විභාග ප්‍රතිඵල අනුව ශිෂ්‍යාධාර ලැබීමට සුදුසුකම් ලැබුවහොත් නැවත ආදායම සහතික කිරීම අවශ්‍ය නොවනු ඇත.

9.5 **දෙමාපියන්ගේ හෝ නීත්‍යානුකූල භාරකරුවන්ගේ හෝ ආදායම නිවැරදිව ඇතුළත් කිරීම විදුහල්පතිගේ වගකීමකි.**

★ මේ පිළිබඳව පසුව කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට හැකියාවක් නොමැති බැවින් ආදායම් තත්ත්වය පිළිබඳව අදාළ තොරතුරු නිවැරදි බවට දෙමාපියන්ගෙන් තහවුරුවක් ලබා ගැනීම ඉතා වැදගත් වේ.

10. ශිෂ්‍යාධාර ලැබීමට හිමිකම ඇත්තේ 2013.02.01 දින සිට 2014.01.31 දින දක්වා කාලය තුළ උපත ලද දැනට 5 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අඩු ආදායම් සහිත සිසුන් සඳහා පමණක් බව දෙමාපියන්/ නීත්‍යානුකූල භාරකරුවන් කල් ඇතිව දැනුවත් කිරීමට කටයුතු කරන්න. මේ පිළිබඳ ව විභාග කොමසාරිස් ජනරාල් හෝ අධ්‍යාපන ලේකම් විසින් නිකුත් කරනු ලබන කොන්දේසි අදාළවන බව කරුණාවෙන් සලකන්න.

උක්ත කරුණු සම්බන්ධයෙන් යම් විමසීමක් කළ යුතු නම් පහත සඳහන් දුරකථන අංකවලට අමතන්න.


දුරකථන අංක : 011-2784537/011-2784208/011-2786616

ෆැක්ස් අංකය (Fax) : 011-2784422

විද්‍යුත් ලිපිනය : gr5schexam@gmail.com


එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கை பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට
5 ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය
பாடசாலைகளுக்கு மாணவர்களைத் தேர்ந்தெடுப்பதற்கும்
மாணவர்களுக்கு உதவிப்பணம் வழங்குவதற்குமாக 5 ஆம்
தர மாணவர்களுக்கு நடாத்தப்படும் பரீட்சை

# ව්‍යවස්ථාව
# பிரமாணங்கள்
# 2023

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට
5 ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

**ව්‍යවස්ථාව**

සියලු ම විදුහල්පතිවරුන් වෙත,

## 1.0 හැඳින්වීම

1.1 මෙම විභාගය "පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට 5 ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය" යනුවෙන් හැඳින්වේ.

1.2 රජය විසින් නියම කරනු ලබන පරිදි දිස්ත්‍රික් මට්ටමින් ශිෂ්‍යාධාර ලබන ශිෂ්‍යත්ව ප්‍රමාණයක් පිරිනැමීම සඳහා ද වැඩි පහසුකම් ඇති ජාතික මට්ටමේ පාසල්වල ඇති පුරප්පාඩු පිරවීම සඳහා ද මෙම විභාගයේදී ලබා ගන්නා වූ මුළු ලකුණු ප්‍රමාණය පදනම් කර ගනු ලැබේ.

1.3 මෙම ව්‍යවස්ථා සංග්‍රහය 1995 හා ඉන් පසු ව පැවැත්වෙන විභාග සඳහා බල පැවැත්වේ.

1.4 **මෙම විභාගයට ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති සිසුන් සිටින සියලු ම විද්‍යාලවල විදුහල්පතිවරුන් මෙම ව්‍යවස්ථාව සුපරීක්ෂාකාරී ව කියවා නියමිත පරිදි පිළිපැදිය යුතු ය.**

1.5 මෙම විභාගය සම්බන්ධයෙන් විමසන සිසුන්ගේ දෙමාපියන්ට හෝ භාරකරුවන්ට හෝ මෙම ව්‍යවස්ථාව කියවා බැලීමට අවස්ථාව සැලසිය යුතු ය. අවශ්‍ය වූ විටෙක ව්‍යවස්ථාව නිසි පරිදි තේරුම් ගැනීමට ඔවුනට උපකාරී විය යුතු ය.

1.6 මෙම විභාගයෙන් ආධාර මුදල් ප්‍රදානය සඳහා තෝරා ගනු ලබන සිසුන් මෙම ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් සපුරාලන බවට වග බලා ගත යුතු ය.

## 2.0 පරමාර්ථ

2.1 වර්ෂයකට රු. 180,000.00 හෝ ඊට අඩු ආදායම් ලබන දෙමව්පියන්ගේ/නීත්‍යානුකූල භාරකරුවන්ගේ දරුවන්ට ආධාර මුදල් ප්‍රදානය කිරීම

2.2 තෝරා ගත් පාසල්වල 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම

උක්ත පරමාර්ථ මුල් කොට මෙම විභාගය 5 ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වේ. මෙම විභාගයේ දී සාමර්ථතා තීරණය කරනු නොලැබේ.

## 3.0 සුදුසුකම්

3.1 සෑම අයදුම්කරුවකු ම ශ්‍රී ලාංකිකයකු විය යුතු ය.

3.2 විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේ රජයේ විදුහලක හෝ රජය විසින් අනුමත කරනු ලැබූ විදුහලක හෝ පස්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුවකු විය යුතු ය. එසේ වුවද 2.1 යටතේ දක්වා ඇති ශිෂ්‍යාධාර ලබා ගැනීම සඳහා හිමිකම ඇත්තේ 2024 ජනවාරි 31 වන දිනට අවුරුදු 11ට අඩු හා අවුරුදු 10 හෝ අවුරුදු 10ට වැඩි සිසුන් සඳහා පමණි.

3.3 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු කිසිදු හේතුවක් මත මෙම විභාගයට ඉදිරිපත් නොකර සිටියහොත් එහි වගකීම විදුහල්පති වෙත පැවරෙන අතර ඊට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ.

## 4.0 ආධාර මුදල් ප්‍රදානය

අයදුම්කරුවන් ශිෂ්‍යාධාර අපේක්ෂා කරන්නේ නම්, ඉහත 3.0 හි දක්වා ඇති සුදුසුකම්වලට අමතර ව

4.1 ඔවුන්ගේ දෙමව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන් සියලු ම මාර්ගවලින් වර්ෂයකට රු. 180,000.00 හෝ ඊට අඩු ආදායම් ලබන අය විය යුතු ය.

4.2 රජය මගින් ක්‍රියාත්මක කරන "සමෘද්ධි" වැඩසටහන මගින් ලැබෙන ප්‍රදානයන් මෙම ආදායම් සීමාවට බලපාන්නේ නැත.

4.3 මෙම සුදුසුකම් සනාථ කිරීම සඳහා මුළු වාර්ෂික ආදායම පිළිබඳ ව ඔබ විසින් අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරන ලදුව ආදායම අඩු හෝ වැඩි ලෙස සඳහන් කර නැවත ඔබ වෙත ලබාගත් ලේඛන පදනම් කර ගත යුතු අතර එම ලේඛන ආරක්ෂා සහිතව ගොනු කර තැබිය යුතු ය.

4.4 විභාග ප්‍රතිඵල අනුව ශිෂ්‍යාධාර ලැබීමට සුදුසුකම් ලැබුවහොත් නැවත ආදායම සහතික කිරීම අවශ්‍ය නොවනු ඇත.

4.5 **දෙමව්පියන්ගේ හෝ නීත්‍යානුකූල භාරකරුවන්ගේ හෝ ආදායම නිවැරදිව ඇතුළත් කිරීම විදුහල්පතිගේ වගකීමකි.**

★ අයදුම්කරුගේ නම හා ආදායම් විස්තර පරීක්ෂා කර බලා එය නිවැරදි බව සහතික කිරීමට දෙමව්පිය/නීත්‍යානුකූල භාරකරු විසින් මුද්‍රණය කරගත් අයදුම්පත්‍රයේ අදාළ තීරුවේ සිය අත්සන යෙදිය යුතු ය. අත්සන යොදා අවශ්‍ය සහතික කිරීම් කර නොමැති අයදුම්කරුවන්ට ඇති වන අපහසුතා පිළිබඳව වගකීම අයදුම්කරුගේ භාරකරු විසින්ම දැරිය යුතු ය.

**ආදායම් තීරුව හිස්ව නොතිබිය යුතු ය.**
**ආදායම වර්ෂයකට රු. 180,000.00ට වැඩි නම් "වැඩි" ලෙස ද ආදායම රු. 180,000.00ට අඩු නම් "අඩු" ලෙස ද ආදායම් සටහන් වන තීරුවේ ඇතුළත් කරන්න. මෙම තීරුව නොසැලකිලිමත් ව සම්පූර්ණ කිරීම හේතුවෙන් යම් සිසුවකුට ශිෂ්‍යාධාර අහිමි වුවහොත් ඊට වගකිව යුත්තන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට පියවර ගන්නා බව තරයේ සිහි තබා ගත යුතු ය.**

## 5.0 ආධාර මුදල් ප්‍රදාන ක්‍රමය

5.1 මෙම ව්‍යවස්ථාවේ සඳහන් සුදුසුකම් සපුරාලන හා මෙම විභාගයේ ප්‍රතිඵල මත ආධාර මුදල් ලැබීම සඳහා තෝරා ගනු ලබන සිසුන්ට 6 වන ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය තෙක් ආධාර මුදල් ගෙවනු ලැබේ.

5.2 පාසල්වල ශිෂ්‍ය නේවාසිකාගාර ඇතොත් ඒවායේ ඇති වන පුරප්පාඩු පිරවීමේදී ද ශිෂ්‍යාධාරලාභීන්ට ප්‍රමුඛත්වය හිමි වේ.

## 6.0 ආධාර මුදල් ප්‍රදාන කාල සීමාව

6.1 ප්‍රථමයෙන් මෙම කාලසීමාව අවුරුදු 6 කට සීමා වේ.

6.2 මෙම සය අවුරුදු කාලය තුළ ශිෂ්‍යාධාරලාභියා අඛණ්ඩව අ.පො.ස.(සා.පෙළ) දක්වා ඉගෙනීමෙන් පසු එය තව දුරටත් දීර්ඝ කිරීම සලකා බලනු ලබන්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටින මුල් වතාවේ දී ම අ.පො.ස.(උ.පෙළ) පන්තියට ඇතුළත් වීමට අවශ්‍ය සුදුසුකම් ලද හොත් පමණි.

6.3 මෙසේ දීර්ඝ කරනු ලබන ශිෂ්‍යාධාර අ.පො.ස.(උ.පෙළ) පන්තියට ඇතුළත් වූ දින සිට අවුරුදු දෙකක කාල සීමාවක් සඳහා ගෙවනු ලැබේ.

6.4 ශිෂ්‍යාධාරලාභීන් විසින් පිළිපැදිය යුතු කොන්දේසි පිළිබඳව ආධාර මුදල් ප්‍රදානය කරන අවස්ථාවේ දී දන්වනු ලැබේ. එසේ දන්වනු ලබන කොන්දේසි යථා පරිදි පිළිපැදීම අනිවාර්ය බව විශේෂයෙන් සැලකිය යුතු ය.

## 7.0 විභාග පටිපාටිය

7.1 එක් දිනක් තුළ දී පැවැත්වෙන මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.
I වන පත්‍රය (කාලය පැය 1 යි)
II වන පත්‍රය (කාලය පැය 1 විනාඩි 15 යි)

- I වන පත්‍රය
  සිසුන්ගේ ඉගෙනුම් හැකියා තක්සේරු කිරීම සඳහා සුදුසු අන්දමේ ප්‍රශ්න මෙම පත්‍රයට ඇතුළත් කෙරේ.

- II වන පත්‍රය
  1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දෙවන වාරය දක්වා වූ සමස්ත විෂය මාලාව ම ඇසුරු කරගෙන මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.

7.2

7.2.1 අයදුම්කරුවන් විභාගයට පිළිතුරු සැපයිය යුත්තේ ප්‍රශ්න පත්‍රවල ම ය.
7.2.2 ඔවුන් තමන්ට හිමි විභාග අංකය පමණක් පිළිතුරු පත්‍රයෙහි ලිවිය යුතුය.
7.2.3 තම නම හෝ විදුහලේ නම හෝ ලිවීමෙන් වැළකිය යුතු ය.
7.2.4 පිළිතුරු සැපයීම සඳහා නිල්, කළු පෑනක් හෝ පැන්සලක් හෝ භාවිත කළ යුතු ය.
7.2.5 පැන්සලෙන් පිළිතුරු සපයන්නේ නම් පැහැදිලිව ලියවෙන පැන්සලක් භාවිත කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් ලබා දිය යුතුය.

විදුහල්පතිවරුන් මෙම උපදෙස් තම පාසලේ අයදුම්කරුවන්ට තේරුම් කර දෙනු ඇතැයි ද උපදෙස් අනුගමනය කිරීම පිළිබඳ ව පුහුණුවක් ඔවුන්ට ලබා දෙනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

## 8.0 විභාගය පැවැත්වෙන මාසය

විභාගය පැවැත්වෙන්නේ අගෝස්තු මාසය තුළ දී වුවත් මේ වර්ෂයේ ඔක්තෝබර් මස 15 වෙනිදා විභාගය පවත්වනු ලැබේ.

## 9.0 විභාගයට ඉදිරිපත් වීම

9.1 මාර්ගගත (online) ආකාරයෙන් විභාගයට අයදුම් කිරීමේ උපදෙස් පත්‍රය හා ව්‍යවස්ථාව විභාග කොමසාරිස් ජනරාල් විසින් එවා ඇත. අදාළ උපදෙස් හා ව්‍යවස්ථාව නොලැබී ඇත්නම් විභාග කොමසාරිස් (පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල) වෙතින් විමසිය යුතුය.

9.2 ඉහත (3) ඡේදයේ සඳහන් සුදුසුකම් සියල්ල සපුරා ඇති සිසුන් සියලු දෙනා ම මෙම විභාගයට ඉදිරිපත් කරවීම විදුහල්පතිවරුන්ගේ වගකීමකි. ඉදිරිපත් කරනු ලබන සියලු ම සිසුන්ට විභාගය පැවැත්වෙන දිනය හා වේලාව කල් ඇති ව දැනුම් දීම ද විශේෂයෙන් කළ යුතු ය.

9.3 **උප්පැන්න සහතිකය අනුව ම, නම හා උපන් දිනය විදුහල්පතිවරුන් විසින් ඇතුළත් කළ යුතු ය.**

9.4 මුද්‍රණය කර ගත් ඉල්ලුම් පත්‍රය අයදුම්කරු සහ දෙමාපියන්/භාරකරුවන් ලවා තොරතුරු නිවැරදි බවට තහවුරු කොට ගෙන අත්සන් කර පාසලේ රඳවාගත යුතුය.

**එහිදී සම්පූර්ණ නම, උපන් දිනය, මාධ්‍යය හා ආදායම නිවැරදිව ම ඇතුළත් වී ඇත්දැයි පරීක්ෂාවට දෙමාපියන්ට/භාරකරුවන්ට උපදෙස් දෙන්න. මෙම තොරතුරු නිවැරදිව ඇතුළත් කිරීම විදුහල්පතිගේ පූර්ණ වගකීමකි.**

## 10.0 පැමිණීමේ ලේඛනය

විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන්ගේ විභාග අංක සමඟ සම්පූර්ණ තොරතුරු ඇතුළත් පැමිණීමේ ලේඛනය විභාග දිනට පෙර ඔබ වෙත ලැබෙනු ඇත.

## 11.0 අයදුම්කරුවන්ගේ අනන්‍යතාව

11.1 සිසුන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා ද සිසුවකු වෙනුවෙන් වෙනත් අයකු පෙනී සිටීම හෝ වෙනත් ගැටලුකාරී තත්ත්වයන් ඇති වීම වැළැක්වීම සඳහා ද විදුහල්පති හෝ ඔහුගේ විශේෂ බලය ලත් ගුරුභවතකු හෝ සිසුන් සමග විභාග ශාලාවට පැමිණ, විභාග ශාලාධිපතිට භාර දිය යුතු ය.

11.2 එක් එක් සිසුනට නියමිත ආසනයෙහි ඔවුන් වාඩි කරවීමට විභාග ශාලාධිපතිට සහාය වීම සිසුන් රැගෙන එන ගුරුභවතාගේ වගකීමකි.

11.3 එහෙත් ප්‍රශ්න පත්‍ර බෙදා දීමට කලින් ඔහු /ඇය විභාග ශාලාවෙන් ඉවත් ව යා යුතු ය.

11.4 මේ සඳහා පැමිණෙන විදුහල්පතිට හෝ සිසුන් භාරව සිටින ගුරු භවතකුට හෝ රජයේ මුදල් රෙගුලාසි යටතේ අනුමත විශේෂ දීමනාවක් ගෙවනු ලැබේ.

11.5 විභාග ශාලාවට පැමිණි බවට විභාග ශාලාධිපතිගෙන් ලබාගත් සහතිකයක් ද දීමනා/ විශේෂ ගාස්තු ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

11.6 තමන්ගේ දරුවකු මෙම විභාගයට ඉදිරිපත් වන්නේ නම් සිසුන් රැගෙන යාමට සහභාගී නොවිය යුතු ය.

11.7 සිසුන් ආසනවල වාඩි කර වීමේ දී ඉතාමත් සැලකිලිමත් විය යුතු ය. අයදුම්කරුගේ නිවැරදි විභාග අංකයට අදාළවම වාඩි කර වීම සිසුන් රැගෙන එන විදුහල්පතිගේ / ගුරු භවතාගේ වගකීමක් වනු ඇත.

## 12.0 ප්‍රතිඵල නිකුත් කිරීම හා පාසල් ලබා දීම

12.1 විභාග කොමසාරිස් ජනරාල් විසින් සියලු ම අයදුම්කරුවන් වෙත නිකුත් කරනු ලබන ප්‍රතිඵල අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ආධාර මුදල් ප්‍රදානය කිරීම සඳහා සහ අයදුම් කර ඇති පාසල් ලබා දීම සඳහා සිසුන් තෝරා ගනු ලැබේ.

12.2 එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන්ට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් විදුහල්පතිවරු මගින් ඒ බව දන්වනු ඇත.

12.3 සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ අයදුම්පත් නියමිත කාල සීමාව තුළ විදුහල්පතිවරුන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

12.4 විභාගයේ දී ලැබූ කඩයිම් ලකුණු අනුව ඒ ඒ පාසල්වල ඇති ඇබෑර්තු සංඛ්‍යාව හා දෙමාපියන්ගේ ඉල්ලීම පදනම් කොට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අයදුම්කරුවන් සඳහා පාසල් ලබා දෙනු ඇත.

12.5 ආධාර මුදල් ප්‍රදානය සඳහා තෝරා ගනු ලැබූ අයදුම්කරුවකු මෙහි 3 සහ 4 ඡේදය අනුව නුසුදුස්සකු යැයි පසු ව අනාවරණය වුව හොත් පෙර කී තෝරා ගැනීම අවලංගු කරනු ලැබේ.

12.6 ආධාර මුදල් ප්‍රදානය සඳහා සුදුසුකම් සනාථ කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වන සිසුන්ගේ දෙමාපියන් / භාරකරුවන් එම සිසුන්ගේ සුදුසුකම් මෙහි 4 වන ඡේදය අනුව ආධාර මුදල් ප්‍රදානයට අදාළ ලියවිලිවලින් සිසුවා යොමු කරනු ලබන විදුහල පිහිටි ප්‍රදේශයේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ / කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඔප්පු කළ යුතු ය.

## 13.0 වයස හා ආදායම සනාථ කිරීම

13.1 රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් හෝ නිකුත් කරන ලද උප්පැන්න සහතිකයක් හෝ වයස පිළිබඳ සහතිකයක්, (ශිෂ්‍යයකුගේ උප්පැන්නය ලියාපදිංචි කර නැත්නම්, දෙමාපියන් හෝ භාරකරුවන් විසින් ඉදිරිපත් කරන දිවුරුම් පෙත්සමක්) ඉදිරිපත් කළ යුතු ය.

13.2 එම දිවුරුම් පෙත්සමේ ශිෂ්‍යයාගේ උප්පැන්නය ලියාපදිංචි කොට නැති බව ද එය ලියා පදිංචි කොට උප්පැන්න සහතිකයක් හෝ වයස පිළිබඳ සහතිකයක් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් ලබා ගැනීමට කටයුතු කරන බව ද දෙමාපියන් හෝ භාරකාරයා හෝ දන්නා පරිදි, ශිෂ්‍යයාගේ උපන් දිනය සහ උපන් ස්ථානය මේ යැයි ද සඳහන් කළ යුතු ය.

13.3 දිවුරුම් පෙත්සම් භාර ගනු ලබන්නේ තාවකාලික වශයෙන් බව දෙමාපියන් සහ භාරකරුවන්ට තේරුම් කර දිය යුතුය. උප්පැන්න සහතිකය හෝ වයස පිළිබඳ සහතිකය ලැබුණු වහා ම දෙමාපියන් හෝ භාරකරුවන් හෝ විසින් එය ඉදිරිපත් කළ යුතු වේ.

13.4 මෙම ව්‍යවස්ථාවන්හි 3.0 ඡේදයේ දක්වා ඇති නියමයන් අනුව අයදුම්කරු විභාගයට පෙනී සිටි පාසලේ විදුහල්පතිගේ සහතිකයක්

13.5 මෙම ව්‍යවස්ථාවෙහි 4.0 ඡේදයේ දක්වා ඇති නියමයන් අනුව මව්පිය දෙදෙනාගේ / නීත්‍යනුකූල භාරකරුගේ මුළු වාර්ෂික ආදායම් පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය. (මුදල් ආධාර ලැබීමට හිමිකම් ඉදිරිපත් කරන සිසුන්ට මේ ලියවිල්ල අදාළ වේ.)

## 14.0 වෙනත් කරුණු

මෙම ව්‍යවස්ථාවෙන් විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ ව තීරණයකට එළඹීම විභාග කොමසාරිස් ජනරාල් විසින් (අවශ්‍ය නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ ද අනුමැතිය ඇති ව) සිදු කරනු ඇත.

2023.06.14
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්